නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය
வீடமைப்பு மற்றும் சமுர்த்தி அமைச்சு
Ministry of Housing and Samurdhi

4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4 tJ khb nrjrugha gjjuKyy
4th floor, **Sethsiripaya ,Battaramulla**

# දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
## வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
## Department of Divineguma Development

මගේ අංකය / எனது இல / My No: ..DDD/HQ/07/SD/ශක්.නි............

ඔබේ අංකය / உமது இல / Your No: ...........................................

දිනය / திகதி / Date: .........2015.06.............................

සියළුම දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්

සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂකවරුන්

### මත්ද්‍රව්‍ය භාවිතය හා නීතිවිරෝධි ප්‍රවාහනය පිටුදැකීමේ ජාත්‍යන්තර දිනය ජුනි 26

සෑම වර්ෂයකම ජුනි මස 26 දිනට යෙදෙන ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය විරෝධී දිනය මෙවරත් මත්ද්‍රව්‍ය භාවිතය හා නීති විරෝධී ප්‍රවාහනය පිටුදැකීමේ අරමුණින් දීපව්‍යාප්තව විවිධ වැඩසටහන් ඔස්සේ සැමරීමට සැළසුම් කර ඇත. විශේෂයෙන් අතිගරු ජනාධිපතිතුමාගේ දැඩි අවධානයට ලක්ව ඇති මෙම දිනය තේමා කරගෙන දිර්ඝ කාලයක් තිස්සේ ප්‍රජාවගේ මත්ද්‍රව්‍ය භාවිතය අවම කරමින් ඔවුන් ආර්ථික හා සමාජීය වශයෙන් ශක්තිමත් කිරිමේ කාර්යය නියැලි සිටින දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවද ඒ සඳහා දායකවීමට සැළසුම් කර ඇත.

ඒ යටතේ විශේෂයෙන්ම ජුනි මස 26 දිනෙන් ආරම්භ වී සතියක් පුරා ළමුන්, කාන්තාවන් , තරුණ තරුණියන් හා මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් ඉලක්ක කර “මත්ද්‍රව්‍ය භාවිතය හා නීති විරෝධි ප්‍රවාහනය” යන තේමාව යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඉටුකිරිම මැනවැයි යෝජනා කරමි. දැනටමත් ඔබ විසින් සැලසුම් කළ වැඩසටහන් ඇත්නම් ඉහත දිනවල එම වැඩසටහන් ප්‍රමුඛත්වයක් දී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්න.

1. කාන්තාවන් ඉලක්ක කළ පුහුණු වැඩසටහන්

2. පාසල් ළමුන් ඉලක්ක කර දේශන හා සම්මන්ත්‍රන

3 මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් ඉලක්ක කර නිවාරණ වැඩසටහන්

තවද මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරිමේ දී අනෙකුත් රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන සමග ඒකාබද්ධව සංවිධානය කිරිමට හා ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්න.

ඉහත සතිය තුළ අවම වශයෙන් එක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයක එක් වැඩසටහනක් සංවිධානය කිරිමටත්, ඒ සඳහා සමාජ සංවර්ධන පදනමේ අරමුදලින් රුපියල් 5000.00 මුදලක් වැය කිරීමටත් අනුමත කරමි. ඉහත තේමාවන්ට අදාල සමාජ සංවර්ධන පදනමේ අනුමත වැඩසටහන් ඇත්නම් එම වැඩසටහන් ඉහත දිනවල ක්‍රියාත්මක කිරිමට කටයුතු කරන්න.

මෙම වැඩසටහන පිළිබඳව සියළුම ප්‍රාදේශිය ලේකම්වරු දැනුවත් කර දිවිනැගුම නිළධාරින් මගින් වැඩසටහන ක්‍රියාත්මක කිරීමටත් එහි ප්‍රගතිය වැඩසටහන නිමවී සතියක් ඇතුලත මා වෙත වාර්තා කිරීමටත් කටයුතු කරන්නේ නම් මැනවි.

ධම්මික ගුණවර්ධන
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)
දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව